**සබරගමුව පළාත් සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය**

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පරිවාස ,ළමාරක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ**

**ළමා සංවර්ධන සහකාර III වන ශ්‍රේණියට බඳවා ගැනීම - 2024**

**1.0** 2019.12.30 දින සිට ක්‍රියාත්මක වන පරිදි සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද සබරගමුව පළාත් පරිවාස, ළමාරක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන සේවා ගණයට (PL 1 – 2016 ) අයත් **ළමා සංවර්ධන සහකාර III වන ශ්‍රේණියේ තනතුරට** විවෘත පදනමින් බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**2.0** මෙම බඳවා ගැනීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සබරගමුව පළාත් සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් පවත්වනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය යථා කාලයේදී දන්වනු ඇත. මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව 1990.03.09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හි සඳහන් විධිවිධානයන් පරිදි ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වූවන් විසින් ලබා ගන්නා ලද මුළු ලකුණු කුසලතා අනුපිළිවෙල අනුව සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් , සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි ළමා සංවර්ධන සහකාර III වන ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත.

**3.0** මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මඟින් සම්පූර්ණ කරනු ලබන **පුරප්පාඩු සංඛ්‍යාව 03** කි. පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. මෙම බඳවා ගැනීමේ නිවේදනය අනුව පුරප්පාඩු පිරවීම හෝ පුරප්පාඩු නොපිරවීම සම්බන්ධයෙන් අවසාන තීරණය ගැනීම සබරගමුව පළාත් සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් සතුවේ.

**4.0 තනතුරට හිමි වැටුප් පරිමාණය :**

අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව **ළමා සංවර්ධන සහකාර III වැනි ශ්‍රේණියට** අදාළ වැටුප් කාණ්ඩය PL 1 - 2016 වන අතර අදාළ මාසික වැටුප් පරිමාණය රු.24,250-10×250-10×270- 10×300- 12×330- රු.36,410/- වේ.

**5.0 සුදුසුකම් :- සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ළමා සංවර්ධන සහකාර III වන ශ්‍රේණියේ** තනතුරට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

**(අ).අධ්‍යාපන සුදුසුකම් :**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන (02) ක් සහිතව විෂයයන් හයකින් (06) සමත් වී තිබීම.

**(ආ). වෘත්තීය සුදුසුකම් :**

අදාළ නොවේ.

**(ඇ).පළපුරුද්ද :**

රජයේ හෝ අර්ධ රාජ්‍ය, විශේෂ අවශ්‍යතා සහිත දරුවන් රැකබලා ගැනීම, ඔවුන්ගේ සංවර්ධනය උදෙසා වැඩසටහන් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම සම්බන්ධ අවම වශයෙන් වසරකට නොඅඩු පළපුරුද්ද

**(ඈ).කායික සුදුසුකම් :**

සෑම අපේක්ෂකයකුම සබරගමුව පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**(ඉ). වෙනත් :**

I. අයදුම්පත් කැඳවනු ලබන දිනට අයදුම්කරු සබරගමුව පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු අතර, අයදුම්පත් කැඳවනු ලබන දිනට පූර්වාසන්න වසර 03 තුළ අයදුම්කරුට සබරගමුව පළාතේ වසර 03ක ස්ථිර පදිංචිය නොමැත්තේ නම් අයදුම්කරුගේ කලත්‍රයා අයදුම්පත් කැඳවනු ලබන දිනට පූර්වාසන්න වසර 03 ක කාලය තුළ සබරගමුව පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

II. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

III. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

IV. සෑම අයදුම්කරුවකුම බඳවාගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් , එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

**(ඊ). වයස් සීමාව:**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**6.0** බඳවා ගැනීමේ ක්‍රමය :

- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර ලකුණුවල ප්‍රමුඛතාව මත ඉහළම කුසලතාවය දක්වන අයදුම්කරුවන් කුසලතා අනුපිළිවෙලට පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන ප්‍රමාණයක් රා.පරි.චක්‍රලේඛ 15/90 විධි විධාන පරිදි දිස්ත්‍රික් ජන අනුපාතය අනුව බඳවා ගනු ලැබේ.

**ඉහත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් :**

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br>i. අ.පො.ස(උ.පෙළ) - සියළු විෂයයන් සමත්වීම<br>❖ අධි සම්මාන සහිතව 15<br>❖ සාමාන්‍ය සාමාර්ථ 10<br>ii. ඩිප්ලෝමා | 15<br>20 | 20 |
| 02. දහම් පාසල් අවසාන සහතිකය ලබා තිබීම. | 10 | 10 |
| 03. වෘත්තීය සුදුසුකම්<br>තෘතීය හා වෘත්තීය කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති පරිදි NVQ 2,3,4 මට්ටමේ සහතිකය | 20 | 20 |
| 04. පළපුරුද්ද<br>අවුරුද්දකට ල. 5 බැගින් උපරිම ල.30කි. (දෙවන වසරේ සිට ලකුණු ලබාදෙනු ඇත.) | 30 | 30 |
| 05. විශේෂ කුසලතා<br>ක්‍රීඩා / නායකත්වය / සමාජ සුභසාධන කටයුතු (එක් සහතික පත්‍රයකට ල.2 බැගින් උපරිම ල.10) | 10 | 10 |
| 06. සම්මුඛ පරීක්ෂණයේදී පෙන්වන කුසලතා | 10 | 10 |
| | | 100 |

සම්මුඛ පරීක්ෂණය සමත්වීම සඳහා යටත් පිරිසෙයින් ලකුණු හතළිහක් (40%) අපේක්ෂකයකු විසින් ලබාගත යුතුවන අතර, පවතින පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

**7.0**අයදුම්පත්‍ර :

A4 (21cmx29cm) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්ත භාවිතා කරමින්,

(අ). අංක 01 සිට 04 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද

(ආ). අංක 05 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද ඇතුළත් වන සේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර තම අත් අකුරින්ම පැහැදිළිව අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුතුය.

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හෝ නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හෝ නියමිත අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැති හෝ නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලබා දී ඇති උපදෙස් අනුව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් සම්බන්ධව කිසිදු වගකීමක් දරනු නොලැබේ. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

**7.1** මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට සබරගමුව පළාත් සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය විසින් ඉඩදෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණට පෙනී සිටීම සඳහා කැඳවීම් ලිපියක් යොමු කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා බඳවා ගැනීමේ නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. අයදුම්කරු විසින් සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට කැඳවීම් ලිපිය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

**7.2** අයදුම්පත්‍රයේද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට අයදුම්කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ ප්‍රධානියකු/ විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්වයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් හෝ රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවාගත යුතුය.

**7.3** සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **2024.08.30** දිනට හෝ ඊට පෙර **"ලේකම්, සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය, සබරගමුව පළාත් සභාව,නවනගරය, රත්නපුර"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**7.4** අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ළමා සංවර්ධන සහකාර III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම -2024 "** යන්න හා ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය සඳහන් කරන්න.

**8.0** අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු රියදුරු බලපත්‍රය

**9.0 ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්**

ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ සම්මුඛ පරීක්ෂණය අවස්ථාවේදී හෝ සම්මුඛ පරීක්ෂණයෙන් පසු හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

**10.0** මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව සබරගමුව පළාත් සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ. සියලුම අයදුම්කරුවන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

දිනීෂා එස්. රත්නායක
ලේකම්
සමාජ සුබසාධන පරිවාස හා ළමාරක්ෂක
ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව

2024 ජූලි මස 11වැනි දින

සබරගමුව පළාත් රාජ්‍ය සේවය

සබරගමුව පළාත් පරිවාස, ළමාරක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ළමා සංවර්ධන සහකාර III වන ශ්‍රේණියට බඳවා ගැනීම- 2024

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : කෑගල්ල - 24 රත්නපුර - 25 ☐

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.0 1.1 මුලකරු අගට යොදා මුලකුරු සමඟ නම :

..........................................................................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ( උදා : PERERA, A.B.C )

1.2 සම්පූර්ණ නම: ..........................................................................................................

..........................................................................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :..........................................................................................................

..........................................................................................................................

(සිංහලෙන්/ දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය:

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

2.0 2.1 ස්ථිර ලිපිනය:..........................................................................................................

..........................................................................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

2.2 ස්ථිර ලිපිනය:..........................................................................................................

..........................................................................................................................

(සිංහලෙන්/දෙමළෙන්)

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය : ..........................................................................................

..........................................................................................................................

2.4 පෞද්ගලික දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

3.0 ස්ත්‍රී/ පුරුෂ භාවය : පුරුෂ - 0 ස්ත්‍රී - 1 ☐

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.0 4.1 උපන් දිනය :

| වර්ෂය | | | | මාසය | | දිනය | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

4.2 ......................... දිනට වයස :

| අවුරුදු | | මාස | | දින | |
|---|---|---|---|---|---|
| | | | | | |

5.0 පදිංචිය සනාථ කිරීම

5.1 සබරගමුව පළාත තුළ ස්ථිර පදිංචිය ඇත්තේ අයදුම්කරුට ද? කලත්‍රයාට ද? යන වග :

.....................................................................................................................................

5.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය: .........................................................................

5.3 සබරගමුව පළාත තුළ පදිංචිව සිටින කාල සීමාව :

........................................... සිට ...........................................දක්වා

5.4 ග්‍රාම නිලධාරී කොට්ඨාසය : ..........................................................................

6.0 අධ්‍යාපන සුදුසුකම්

6.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය

6.1.1. අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තරය

<u>පළමු වර</u>

i. විභාගයේ වර්ෂය හා මාසය: ................................................

ii. විභාග අංකය : ...................................................................

iii. ප්‍රතිඵල :

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

<u>දෙවන වර</u>

i. විභාගයේ වර්ෂය හා මාසය: ................................................

ii. විභාග අංකය : ...................................................................

iii. ප්‍රතිඵල :

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

6.2 අ.පො.ස. (උ.පෙළ) විභාගය

6.2.1. අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තරය

i. විභාගයේ වර්ෂය හා මාසය: .......................................................

ii. විභාග අංකය: ..........................................................................

iii. ප්‍රතිඵල:

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 3. | |
| 2. | | 4. | |

6.3 ඩිප්ලෝමාව පිළිබඳ විස්තර

........................................................................................................................................................

6.4 වෘත්තීය සුදුසුකම්

6.4.1. තෘතීය හා වෘත්තීය කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති පරිදි NVQ 2,3,4 මට්ටමේ සහතිකය පිළිබඳ විස්තර

i. සහතික පත්‍රයේ අංකය : .....................................

ii. නිකුත් කළ දිනය : ............................................

iii. සහතික පත්‍රය නිකුත් කළ ආයතනයේ නම : ............................................................

(සහතික පත්‍රයේ ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතුය.)

6.5 පළපුරුද්ද

..................................................................................................................................................

..................................................................................................................................................

7.0 ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?
(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

| ඔව් | නැත |
|---|---|

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

8.0 අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ ප්‍රකාශය :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමෙහි හා විශ්වාසයේ හැටියට සත්‍ය බව ප්‍රකාශ කරමි. මා විසින් සපයා ඇති තොරතුරු අසම්පූර්ණ හෝ අසත්‍ය බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත්, පසුව අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි. තවද සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ බලය පවරනු ලබන වෙනත් ආයතනයක් විසින් පනවනු ලබන නීති රීති වලට හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණ වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

දිනය: .......................                ....................................................

අයදුම්කරුගේ අත්සන

10.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම් පත්‍රය ඉදිරිපත් කරනු ලබන ............................................................... මයා / මිය / මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවටත් ඔහු/ඇය මා ඉදිරිපිටදී .....................................දින ඔහුගේ /ඇයගේ අත්සන තැබූ බවටත් සහතික කරමි.

දිනය:..............................                ......................................................

සහතික කරන්නාගේ අත්සන

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : .....................................................

තනතුර: ...................................................

ලිපිනය: ..................................................

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)